# ECONOMIC GROWTH
# &
# DEVELOPMENT
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# සංවර්ධනය මිනුම් කිරීම සඳහා යොදා ගන්නා දර්ශක

සංවර්ධනය මිනුම් කිරීම සඳහා යොදා ගන්නා දර්ශක ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

- **ආර්ථික දර්ශක**
- **සංයුක්ත දර්ශක**

## ආර්ථික දර්ශක

සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා ආර්ථික දර්ශක පහත දැක්වේ.

Class Work.LK

- **ප්‍රතිශීර්ෂ ආදායම**

ප්‍රතිශීර්ෂ ආදායම යනු දේශීය හෝ ජාතික ආදායමේ වටිනාකම ජනගහනයට සාපේක්ෂ ගණනය කළ විට එක් පුද්ගලයකුට ලැබෙන ආදායම යි. එය මූර්ත වශයෙන් මෙන් ම මූල්‍ය වශයෙන් ද ගණනය කළ හැකි ය.

ප්‍රතිශීර්ෂ ආදායම ගණනය කරනුයේ පහත සඳහන් අයුරෙනි.

$$\text{ප්‍රතිශීර්ෂ ආදායම} = \frac{\text{දළ දේශීය / ජාතික ආදායම}}{\text{මධ්‍ය වාර්ෂික ජනගහනය}}$$

- **දළ දේශීය හා දළ ජාතික ආදායමේ වර්ධනය**
- **දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික වර්ධනය (කෘෂිකාර්මික, කාර්මික, සේවා)**
- **දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය**
- **ඉතිරි කිරීම් (දේශීය, ජාතික)**

ClassWork.LK

- **ආයෝජන (පෞද්ගලික, රාජ්‍ය)**

- **උද්ධමනය**

මෙම ආර්ථික දර්ශකවලින් ආර්ථිකයේ විවිධ අංශවල සංවර්ධන මට්ටම් මැන බැලේ. එම නිසා ඒවා ආංශික මිනුම් ය.

ClassWork.LK

## සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල වැදගත්කම

සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල වැදගත්කම පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

- සංවර්ධනය මැනීම සඳහා ප්‍රතිශීර්ෂ ආදායම යොදා ගන්නා විට, වඩාත් යෝග්‍ය මිනුම වන්නේ ප්‍රතිශීර්ෂ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය යි. මෙමගින් සැබෑ වශයෙන් භාණ්ඩ හා සේවා ප්‍රමාණයේ වෙනස් වීම හඳුනා ගත හැකි ය.
- එමෙන් ම වර්ෂය තුළ සිදු වන මුළු නිෂ්පාදිතයෙන් ජනතාවට වර්තමාන හා අනාගත පරිභෝජනය සඳහා ලැබෙන ප්‍රමාණය හඳුනා ගැනීමට ඉඩ සැලසේ.
- සමස්තයක් වශයෙන් රටක ජනතාව ලබන ප්‍රතිලාභ මෙම දර්ශකය මගින් මැනේ. එනම් පරිභෝජනය හා ආයෝජනය සඳහා රටක ජනතාවට ලබාගත හැකි මූර්ත භාණ්ඩ හා සේවා ප්‍රමාණය කොපමණ දැයි මෙමගින් ගණනය කළ හැකි ය.

- රටවල් අතර දියුණුව සැසඳීමේ දර්ශකයක් ලෙසද වැදගත් වේ.

ClassWork.LK

## සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල අවාසි

- සංවර්ධනය මිනුම් කිරීමේ ආර්ථික දර්ශකවල පහත සඳහන් අඩුපාඩු හඳුනා ගත හැකි ය.

- ඉහත සඳහන් ආංශික දර්ශක සියල්ල ම ගණනය කරනු ලබන්නේ ජාතික ආදායම් ගිණුම් දර්ශක පදනම් කරගෙනය.

- එසේ වුවත් ජාතික ආදායම් ගිණුම් දත්තවල පවත්නා දුර්වලතා සහ ඒවා සකස් කිරීමේ දී පැන නගින ගැටලු සැලකිල්ලට ගත් විට සංවර්ධනයේ ආර්ථික පැතිකඩ මෙම දර්ශක මගින් නිවැරදි ව මැනේ ද යන්න ගැටලුවකි.

ClassWork.LK

## ජාතික ආදායම් දත්ත යොදා ගැනීමේ දී පැන නැගෙන ඌනතා

- ද්වි ගණන දෝෂ හට ගැනීම

- භාණ්ඩවල ගුණාත්මක තත්ත්වයේ හට ගන්නා වෙනස්කම් පෙන්නුම් නොකිරීම

- වෙළෙඳපොළ ගනුදෙනුවලට පාත්‍ර නොවන ඵලදායි ආර්ථික කටයුතුවල එකතු කළ අගයන් වාර්තා නොවීම

- ශුභසාධනයට අහිතකර අවගුණ භාණ්ඩ නිෂ්පාදන දත්ත ඇතුළත් වීම

- නිෂ්පාදනය නිසා හට ගන්නා ස්වාභාවික සම්පත් ක්ෂය වීම් හා පරිසරයට සිදු වන හානි සැලකිල්ලට නොගැනීම

- ආදායම් බෙදී යන ආකාරය පිළිබිඹු නොවීම

- විදේශ ණය ගැති භාවය සහ විදේශ සම්පත් ක්ෂය වීම් ජාතික ගිණුම් තුළින් පිළිබිඹු නොවීම

ClassWork.LK

- භෞතික ශුභසාධනයට අදාළ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පමණක් ජාතික ගිණුම් තුළට ඇතුළත් කිරීම

- ආර්ථිකයේ ව්‍යූහාත්මක වෙනස්කම් පෙන්නුම් නොකිරීම

- රටවල් අතර සංවර්ධන මට්ටම් සැසඳීමේ දී ප්‍රතිශීර්ෂ ආදායම, නාමික විනිමය අනුපාතිකය යොදා ගනිමින් ඇමරිකානු ඩොලර් ඒකකවලින් ප්‍රකාශ කිරීම

ClassWork.LK

# ප්‍රතිශීර්ෂ ආදායම මත රටවල් වර්ගීකරණය

ප්‍රතිශීර්ෂ ආදායම පදනමක් ලෙස යොදා ගෙන ලෝක බැංකුව ලෝකයේ රටවල් පහත සඳහන් අයුරෙන් වර්ගීකරණය කරයි.

- අඩු ආදායම් රටවල් (ඩොලර් 975 හෝ ඊට අඩු)
- පහළ මැද ආදායම් රටවල් (ඩොලර් 977 - 3855)
- ඉහළ මැද ආදායම් රටවල් (ඩොලර් 975 - 11905)
- ඉහළ ආදායම් රටවල් (ඩොලර් 11906 හෝ ඊට වැඩි)

ClassWork.LK

## සංයුක්ත දර්ශක

සංවර්ධනය මැනීම සඳහා යොදා ගන්නා සංයුක්ත දර්ශක පහත දැක්වේ.

- මානව සංවර්ධන දර්ශකය
- සන්තුෂ්ටි දර්ශකය

## මානව සංවර්ධන දර්ශකය

ලෝකයේ විවිධ රටවල සමාජ ආර්ථික සංවර්ධනය පරික්ෂා කර බැලීම සඳහා වඩා පරිපූර්ණ හා විශ්ලේෂණාත්මක මිනුමක් වශයෙන් 1990 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් මානව සංවර්ධන දර්ශකය හඳුන්වා දී ඇත.

මෙම දර්ශකය මගින් රටක ආර්ථිකයේ පුළුල් පැතිකඩක් ආවරණය කරන අතර වසරින් වසර යාවත්කාලීන කරමින් පවත්වා ගෙන යයි.

මානව සංවර්ධනය මැනීම සඳහා නිර්ණායක විශාල සංඛ්‍යාවක් භාවිත කළ හැකි වුවත් සංවර්ධනයේ ප්‍රධාන අරමුණු 3ක් වන සෞඛ්‍ය, දැනුම හා ජීවන මට්ටමට අදාළ සංරචක 3ක් යොදා ගනිමින් මෙම දර්ශකය සකස් කර ඇත.

ClassWork.LK

ශ්‍රී ලංකාව 2015 වර්ෂය වන විට මානව සංවර්ධන දර්ශකයේ අගය 0.0750ක් ලබා ගනිමින් ලෝකයේ රටවල් අතර 73 වන ස්ථානයේ පසු වේ. දකුණු ආසියානු කලාපීය රටවල් අතර ප්‍රථම ස්ථානයේ පසු වේ.

## මානව සංවර්ධන දර්ශකයට ඇතුළත් කර ඇති ප්‍රධාන සංරචක 3

- උපතේ දී ආයු අපේක්ෂාව (සෞඛ්‍ය)
- පාසල් අධ්‍යාපනය ලැබූ අතර සංඛ්‍යාවේ මධ්‍යයන අගය (දැනුම)
- පාසල් අධ්‍යාපනයට යොමු වන දරුවකු අධ්‍යාපනයේ නිරත වෙතැයි අපේක්ෂිත වසර සංඛ්‍යාව (දැනුම)

ClassWork.LK

# මානව සංවර්ධන මට්ටම් යටතේ රටවල් වර්ගීකරණය

මානව සංවර්ධන දර්ශකයේ අගය පදනම් කර ගනිමින් ලෝකයේ රටවල් මානව සංවර්ධන මට්ටම් 4ක් යටතේ වර්ග කරයි.

- ඉතා ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල්
- ඉහළ මානව සංවර්ධනයක් සහිත රටවල්
- මධ්‍යම මානව සංවර්ධනයක් සහිත රටවල්
- අඩු මානව සංවර්ධනයක් සහිත රටවල්

මෙම වර්ගීකරණය කර ඇත්තේ මානව සංවර්ධන දර්ශකයේ නිරපේක්ෂ දර්ශක අගයන් මත නොව රටවල් සියල්ල එක්ව ගෙන ඒවායේ සාපේක්ෂ තත්ත්වය සැලකිල්ලට ගනිමිනි.

ClassWork.LK

## මානව සංවර්ධන දර්ශකයේ ප්‍රබලතා

සංවර්ධන මිනුමක් ලෙස මානව සංවර්ධන දර්ශකයේ පහත සඳහන් ප්‍රබලතා දැකිය හැකි ය.

- ගෝලීය වශයෙන් කෙරෙන සැසඳීම්වල දී සංවර්ධනය මනින වඩාත් තොරතුරු සහිත නිර්ණායක වශයෙන් මානව සංවර්ධන දර්ශකය වැදගත් වේ.

- සංවර්ධනයට අයත් දෑ කවරේ ද සංවර්ධන ක්‍රියාවලියේ දී සාර්ථක වී ඇති රටවල් කවරේ ද යන්න පිළිබඳ ව දැනුම හා අවබෝධය පුළුල් කර ගැනීම සඳහා නිර්මාණය කර ඇති ඉතා ප්‍රයෝජනවත් මිනුමක් ලෙස මානව සංවර්ධන දර්ශකය වැදගත් වේ.

- සංවර්ධනය යනු මිනිසාට තේරීම් කිරීමට ඇති නිදහස පුළුල් කෙරෙන ක්‍රියාවලියක් බැවින් එය තීරණය වන්නේ හුදෙක් ආදායම් මට්ටම මත පමණක් නොව ආයු අපේක්ෂණය, සාක්ෂරතාව, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි සමාජීය සාධක මගිනි. මානව සංවර්ධන දර්ශකය මේවා සැලකිල්ලට ගෙන ඇත.

- සංවර්ධනය මැනීමේදී යොදා ගන්නා ප්‍රතිශීර්ෂ ආදායම වැනි පටු මිනුම්වලින් හට ගන්නා සීමාකම් මානව සංවර්ධන දර්ශකයෙන් පහ ව යයි.

ClassWork.LK

## මානව සංවර්ධන දර්ශකයේ දුබලතා

සංවර්ධන මිනුමක් වශයෙන් මානව සංවර්ධන දර්ශකයේ පහත සඳහන් දුබලතා දැකිය හැකි ය.

- මානව සංවර්ධන දර්ශක සමාහාර මිනුමක් වන බැවින් රටවල් අභ්‍යන්තරයේ දැකිය හැකි සංවර්ධන විෂමතාවන් (ආදායම් ව්‍යාප්තිය, ප්‍රදේශීය සංවර්ධනය වැනි) හඳුනා ගත නොහැකි ය.

**නිදසුන් :**

සංවර්ධනයට අදාළ සියලු අංශ මේ යටතේ සැලකිල්ලට නොගනී. එනම්. සහභාගිත්වය, දේශපාලන නිදහස, මානව ආරක්ෂාව වැනි අංශ

- ගුණාත්මක වෙනස්කම් මෙම දර්ශකයෙන් සැලකිල්ලට නොගනී.

**නිදසුන් :**

පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක තත්ත්වය, සෞඛ්‍ය පහසුකම්වල ගුණාත්මක වෙනස්කම්

ClassWork.LK

- අධ්‍යාපනය මිනුම් කිරීමේ දී ප්‍රාථමික අධ්‍යාපනයට ආරම්භයේ දී ම යොමු වූ ශිෂ්‍ය සංඛ්‍යාව පමණක් සැලකිල්ලට ගනී. එහෙත් අතරමඟ දී පාසල් හැරයන ප්‍රමාණය සැලකිල්ලට නොගනී.

- සංවර්ධනය කෙරෙහි බලපාන පාරිසරික පැතිකඩ මෙම දර්ශකය තුළ අන්තර්ගත නොවේ.

- දර්ශකයට අදාළ ප්‍රධාන පැතිකඩ සඳහා සමාන බර තැබීමක් කර ඇත.

ClassWork.LK

## සන්තුෂ්ටි දර්ශකය

ලෝකයේ රටවල සමාජ, ආර්ථික, සංස්කෘතික, දේශපාලන හා පාරිසරික සියලුම අංශවල සංවර්ධනය මැන බැලීම සඳහා 2008 වර්ෂයේ දී සන්තුෂ්ටි දර්ශකය හඳුන්වා දී ඇත.

## සන්තුෂ්ටි දර්ශකයට ඇතුළත් වන සංරචක

සන්තුෂ්ටි දර්ශකයට ඇතුළත් වන සංරචක පහත දැක්වේ.

- යහපාලනය
- පරිසරය
- සංස්කෘතිය
- මානසික සතුට
- කාල කළමනාකරණය
- අධ්‍යාපනය
- සෞඛ්‍යය
- ජීවන තත්ත්වය
- සමාජීය සබඳතා

ClassWork.LK

# ක්‍රය ශක්ති සාම්‍යය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම

$$\text{ක්‍රය ශක්ති සාම්‍යය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම} = \frac{\text{රටක නිපදවන භාණ්ඩ} \times \text{ඒ ඒ භාණ්ඩයේ ඩොලර් මිල}}{\text{ජනගහනයේ ප්‍රමාණය}}$$

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura